# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2267/42 - 2022 පෙබරවාරි මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : OPDS/LND/04/15/ACQ/G.PUB.BIL/03.

මහජන කටයුත්තක් සඳහා (මාරන්තොටගොඩ මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම) පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන (සංශෝධන) ඉඩම් අත්කර ගැනීමේ පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙලපල්ල පත්තුව, මැද කොරළයේ මාදොළ ග්‍රාම නිලධාරි වසමේ, මාරන්තොටගොඩ ගමේ මාදොළ වත්ත නමැති ඉඩමේ අ.ග.පි. 203 අතිරේක අංක 46 පත්‍ර අංක 50 හි 1887 හා 1889 යන ඉඩම් කැබලි 02 වේ.

අ.ග.පි. 203, අතිරේක 46, පත්‍ර අංක 50, මාදොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉඩම් කැබලි අංක 1887 හා 1889

01. **කැබලි අංකය.** 1887

ඉඩමේ නමඃ මාදොලවත්ත; ඉඩමට හිමිකම් කියන්නන්ඃ එස්. පී. පතිරණ, රම්‍ය පෙදෙස, ඒදණ්ඩාවල, කුරුවිට; ඉඩමේ ප්‍රමාණයඃ හෙක්ටයාර්. 0.0204.

02. **කැබලි අංකය.** 1889

ඉඩමේ නමඃ මාදොලවත්ත; ඉඩමට හිමිකම් කියන්නන්ඃ එස්. පී. පතිරණ, රම්‍ය පෙදෙස, ඒදණ්ඩාවල, කුරුවිට; ඉඩමේ ප්‍රමාණයඃ හෙක්ටයාර්. 0.0205.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියන, සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2022 අප්‍රේල් මස 06 වැනි දින පෙ.ව.10.00 ට ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 මාර්තු මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. ධම්මික සතරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඕපනායක .

2022 පෙබරවාරි මස 09 වැනි දින,
ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

EOG 02-0515

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මාගේ අංකය : 8/3/5/1.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : LD/5/2009/HW/245.

2017.01.30 දිනැති අංක 2004/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ මවිසින් පළකරන ලද දැන්වීම පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු බව දැනුම් දී සිටිමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ මාතලේ නගරය කොට්ඨාස අංක 12 නගරය ගමේ (මාතලේ නගර සභා සීමාව තුළ) පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද මූ.පි.මා.1608 දරන මූලික පිඹුරේ කැබලි අංක 80 දරන ඉඩම් කොටස සඳහා මායිම්:

01. කැබලි අංක 80-වරිපනම් අංක 172 ත්‍රිකුණාමල වීදිය; හිමිකම් කියන්නාඃ ඩී.ජේ.ඊ.ජයමා; ප්‍රමාණයඃ හෙක්.0.0015.

මායිම් :- *උතුරට* : කැබලි අංක 77 සහ 78; *නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස; *දකුණට* : වරි.අංකය 170 ත්‍රිකුණාමල වීදිය, කැබලි අංක 95 සහ 94; *බටහිරට* : කැබලි අංක 81.

EOG 02-0516

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මාගේ අංකය : 8/3/5/1 (II වෙළුම).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : LD/5/2009/HW/245.

2017.02.02 දිනැති අංක 2004/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ ම විසින් පළකරන ලද දැන්වීම පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු බව දැනුම් දී සිටිමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ මාතලේ නගරය කොට්ඨාස අංක 12 නගරය ගමේ (මාතලේ නගර සභා සීමාව තුළ) පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද මූ.පි.මා.1607 දරන මූලික පිඹුරේ කැබලි අංක 70, 91, 132 දරන ඉඩම් කොටස් සඳහා මායිම්:

01. **කැබලි අංක 70** - වරිපනම් අංක 484 සහ 486 ත්‍රිකුණාමල වීදිය; හිමිකම් කියන්නාඃ අජිත් වීරරත්න; ප්‍රමාණයඃ හෙක්.0.0009.

මායිම් :- *උතුරට* : කැබලි අංක 60 සහ 59 සහ වරිපනම් අංකය 490 ත්‍රිකුණාමල වීදිය; *නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස; *දකුණට* : වරිපනම් අංකය 482 ත්‍රිකුණාමල වීදිය, කැබලි අංක 71 සහ 72; *බටහිරට* : කැබලි අංක 69.

02. **කැබලි අංක 91** - වරිපනම් අංක 417 සහ 415 ත්‍රිකුණාමල වීදිය; හිමිකම් කියන්නාඃ එම්.එච්.ගුණපාල; ප්‍රමාණයඃ හෙක්.0.0009.

මායිම් :- *උතුරට* : කැබලි අංක 90,89 සහ වරිපනම් අංක 419 ත්‍රිකුණාමල වීදිය; *නැගෙනහිරට* : කැබලි අංක 92; *දකුණට* : වරිපනම් අංක 413 ත්‍රිකුණාමල වීදිය, කැබලි අංක 101 සහ 102; *බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

03. **කැබලි අංක 132** - වරිපනම් අංක 397 ත්‍රිකුණාමල වීදිය; හිමිකම් කියන්නාඃ ඒ.සී.එම්.නසීර් විසින් අනවසරයෙන් භුක්ති විඳියි; ප්‍රමාණයඃ හෙක්.0.0004.

මායිම් :- *උතුරට* : කැබලි අංක 130 සහ 129; *නැගෙනහිරට* : ත්‍රිකුණාමල වීදිය; *දකුණට* : කැබලි අංක 136, 137 ත්‍රිකුණාමල වීදිය; *බටහිරට* : කැබලි අංක 131.

EOG 02-0517

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.